# තරුණ ගොවි සමාජ ප්‍රවෘත්ති

කෘෂිකර්මාන්තය හා තරුණ ගොවි සංවිධාන පිළිබඳ අධ්‍යාපනයක් ලබාගැනීම සඳහා 1959 වර්ෂයේදී ජපානය කරා ගිය දක්ෂ තරුණ ගොවීන් දස දෙනා ගැන විස්තර මීට පෙරද ගොවිකම් සඟරාවේ පළවී ඇත. ඉහත සඳහන් දැය ගැන වටිනා අධ්‍යාපනයක් ජපානයේදී ලබා දිවයිනට ඔවුන් පෙරලා පැමිණිවිට, එම අධ්‍යාපනයේ සංක්ෂෙප විස්තරයක්, මෙරට සෙසු තරුණ තරුණියන් වෙත දන්වන ලද්දේද මෙම සඟරාව මගිනි.

මෙවර, ජපානයේදී ඉගෙන ගත් නොයෙකුත් නවීන අදහස් හා දියුණු ක්‍රම මෙරට ගොවිතැනට පරිවර්තනය කර වටිනා අස්වනු හා ලාභ ප්‍රයෝජන ලබාගත් මාර්ගය දන්වා ඇති විස්තරයක් ඌව පළාතේ බදුල්ලේ අලිගෙබැද්දේ-හැගොඩ ජේ. ඇම්. රත්නායක තරුණ ගොවි නියෝජිතයාගෙන් කෙරේ.

"අප, ජපානයේදී ක්‍රමානුකූලව යන්ත්‍ර භාවිතා කර, රසායනික පෝර යොදා රසායනික බෙහෙත් යෙදූ කුඹුරේ අක්කරයකින් ලැබූ අස්වැන්න ජපානයේ අප සිටි පෙදෙසේ ගොවිමහතුන් ලබන සාමාන්‍ය අස්වැන්නට වඩා බුසල් 17 කින් වැඩි විය. අප ලැබූ අස්වැන්න බුසල් 157 ක් වීම ජපන් ගොවීන්ටද ලොකු පුදුමයක් විය. එහිදී අප විශෙෂ ප්‍රශංසාවකට හිමිකරුවෝ වූයේ මහන්සි නොබලා එකසේ උත්සාහයෙන් වැඩ කළ නිසයි. ජපානයේදී ලැබූ පුහුණුව අත්හදා බැලීමක් වශයෙන් මෙහිදී පසුගිය මාස් කන්නයේදී වැඩ කළ කුඹුරෙන් මීට පෙර කිසි කලක නොලැබූ විශිෂ්ඨ අස්වැන්නක් උඩුවර ග්‍රාමයේදී ලදිමි. මෙම කුඹුරෙන් මීට පෙර සැමවිට ලබනුයේ වී බුසල් 25 ට අඩු අස්වැන්නකි. ජපානයේ යොදන ක්‍රම අනුව පේළියට පැළ සිටුවා, වල් පැළෑටි නෙලා, රසායනික පෝර හා බෙහෙත් යොදා පළාතට නිර්දේශිත මුරුංගා කායන් නුමුහුන් බිත්තර වියෙන් වගා කළ එම කුඹුරෙන් වී බුසල් 67 ක් මා ලබා ගතිමි.

ලක්දිව සෙසු කුඹුරු සියල්ලද මෙලෙස වගා කිරීමෙන් දැනට ලබන අස්වැන්න මෙන් තුන් ගුණයක් ලබාගත හැකි බව මගේ අදහසයි."

ජපානයේ
ගොවිපලක්





තරුණ ගොවි නියෝජිතයෝ වී තවාහක්
පිළියෙළ කරද්දී

වී ගොවිතැන ගැන ඉගෙන
ගැනීමට දේ එමට තිබේ

